**e - ඥාන පියස වැඩසටහන**
**දියමන්ති ව්‍යාපෘතිය**
**4 සතිය**

| විෂය | ශ්‍රේණිය | වාරය | පාඩම/ඒකකය |
|---|---|---|---|
| චිත්‍ර කලාව | 10 | II | 7.2.2. මැදවල ටැම්පිට විහාරය |

**<u>ඉගෙනුම් ආධාරක</u>**

- ගල් කණු මත ඉදිකළ විහාරයක් වන හෙයින් ටැම්පිට විහාරය ලෙස හඳුන්වන මෙය මහනුවරට නුදුරු මැදවල ග්‍රාමයේ පිහිටා ඇත. අඩි 01 යි අඟල් 08ක් උස් වූ ගල් කණු 34ක් මත ඉදිකර ඇත.
- මැද මහනුවර සම්ප්‍රදායට අයත් ඉතා සියුම් හා විශිෂ්ට නිමාවන්ගෙන් යුතු චිත්‍ර නිර්මාණ දැකිය හැකිය.
- මැදවල විහාරය තුළ දක්නට ලැබෙන කුඩා තීරු සංරචන සිතුවම් අතර ජාතක කතා, සත් සතිය වැනි මාතෘකා විශේෂ වේ. ජාතක කතා අතර වෙස්සන්තර ජාතකය හා උරග ජාතකය ප්‍රධාන තැනක් ගනියි.
- පාර්ශවදර්ශී රූප, අඛණ්ඩ කථන ක්‍රමය, ද්විමාන ලක්ෂණ සහිත පැතලි වර්ණ භාවිතය, වර්ණ සඳහා කහ, කොළ, රතු, කළු, සුදු ආදී වර්ණ භාවිතය, ප්‍රෙස්කෝ සිකෝ ශිල්ප ක්‍රමය, සියුම් රේඛාකරණය හා පසුබිම අවකාශය පිරවීම සඳහා විවිධ සැරසිලි මෝස්තර භාවිතය මෙහි සිතුවම් නිර්මාණ ආශ්‍රිත දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ වේ.


මැදවල ටැම්පිට විහාරය


වෙස්සන්තර ජාතකය

**<u>ඇගයීම</u>**

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1) මැදවල විහාරයේ දැකිය හැකි වාස්තු විද්‍යා ලක්ෂණ විස්තර කරන්න.

2) යුගය, අනුග්‍රහය හා ශිල්පියා ආදිය ඇතුළත් කර මැදවල විහාරයේ ඓතිහාසික පසුබිම කෙටියෙන් පැහැදිලි කරන්න.

3) වස්තු විෂය, ශෛලිය, ශිල්ප ක්‍රමය, වර්ණ භාවිතය යන අංග යොදා ගනිමින් මෙහි දක්නට ලැබෙන සුවිශේෂී සිතුවම් 2ක් පිළිබඳ කලාත්මක ඇගයීමක් කරන්න.